**සැ. යු.**- 2012.02.03 වැනි දින පළ වූ අංක 1,744 දරන *ගැසට් පත්‍රයේ* I-III කොටස පළ නොවීය.

- මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2011 වර්ෂය සඳහා ගාල්ල සහ බලපිටිය අධිකරණ කලාප වලට අයත් සාමාන්‍ය ජූරි සභිකයින්ගේ නාමලේඛනයක් (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍ය වලින් වැඩ කරන) සහ විශේෂ ජූරි සභිකයින්ගේ නාමලේඛනයක් (සිංහල මාධ්‍යයෙන් පමණක් වැඩ කරන) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන්ම පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,745 - 2012 පෙබරවාරි 10 වැනි සිකුරාදා - 2012.02.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 84 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා සියලු ම දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 පෙබරවාරි මස 17 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 පෙබරවාරි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# විවිධ දැන්වීම්

## වසන්ත සේනානායක පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

රාජිව විජේසිංහ වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ "වසන්ත සේනානායක පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි" යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි ඃ

1. අසරණ සහ ආබාධ සහිත වැඩිහිටියන්ට නවාතැන් පහසුකම් සැපයීම හා රැකබලා ගැනීම සහ ඒ තැනැත්තන්ට ආහාර, ඇඳුම් පැළඳුම්, වෛද්‍ය සහ වෙනත් පහසුකම් සැපයීම ;
2. එවැනි අසරණ හා ආබාධ සහිත තැනැත්තන්ගේ ඕනෑ එපාකම් ගැන කටයුතු කිරීම සහ ඔවුන්ගේ අවශ්‍යතාවන් ප්‍රමාණවත් පරිදි ඉටු කිරීම ; සහ
3. ශාරීරික අභ්‍යාස හා ක්‍රීඩා ප්‍රවර්ධනය කිරීම,

යනාදිය වේ.

රාජිව විජේසිංහ,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

02-238

## ශ්‍රී ලංකා පරිගණක සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

තිලංග සුමතිපාල වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 48 (1) යටතේ ශ්‍රී ලංකා පරිගණක සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි ; යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී සංගමය සංස්ථාගත කිරීමයි :

1. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයේ යෙදී සිටින වෘත්තිකයන් සඳහා සංවිධානයක් සැපයීම, එහි වෘත්තීයමය කටයුතු අධීක්ෂණය සහ නියාමනය කිරීම මෙන්ම කර්මාන්තයෙහි ඉහළ වෘත්තීය ප්‍රමිති නගා සිටුවීම සහ පවත්වාගෙන යෑම,
2. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය අධ්‍යයනය සහ ක්‍රියාවේ යෙදවීම ප්‍රවර්ධනය සහ සංවර්ධනය කිරීම මෙන්ම මහජනතාවගේ සුභසිද්ධිය උදෙසා දැනුම ලබාදීම, අධ්‍යාපනය, පුහුණුව සහ පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම සහ ඒ හා සම්බන්ධ තාක්ෂණික දැනුම අත්කර ගැනීම සහ අන්තර් හුවමාරු කරගැනීම,
3. සංගමයේ වැඩසටහන්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් සඳහා අරමුදල් සැපයීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ සහ ශ්‍රී ලංකාවෙන් පිටත ආර්ථික සහ මූල්‍ය කටයුතු ප්‍රවර්ධනය කිරීම, සංවිධානය කිරීම සහ ඒවායේ නියැලීම මෙන්ම එවැනි කටයුතු පවත්වාගෙන යෑම,

යනාදිය වේ.

තිලංග සුමතිපාල,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කොළඹ දිස්ත්‍රික්කය.

02-358

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.